International Labour Organization

Australian AID

Norwegian Embassy
*Colombo*



ශ්‍රී ලංකාවේ, උතුරු පළාත තුළ කාන්තා ආර්ථිකය සවිබල ගැන්වීම සහ ගෞරවාන්විත රැකියාවන් සඳහා වූ ප්‍රවේශයන් ශක්තිමත් කිරීම:

# ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ලීඩ්+ (LEED+) ව්‍යාපෘතිය



# වර්තමාන කාන්තා සවිබල ගැන්වීමේ අනුපාතය අනුව, ආර්ථික සහභාගීත්ව අවස්ථාවල පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පරතරය පියවීම සඳහා වසර 267.6ක් ගත වේ.*

බොහෝ පර්යේෂණ සොයා ගැනීම් වලින් පෙනී යන්නේ ශ්‍රම බලකාය තුළ කාන්තාවන්ගේ පූර්ණ සහභාගිත්වය ජාතික වර්ධන වේගයට සැලකිය යුතු ලෙස දායක වන බවයි. කාන්තාවන් සහ ගැහැණු දරුවන් කේන්ද්‍ර කරගත් ආර්ථික-යක් හරහා සියලු දෙනා හට වඩාත් සාධාරණ හා තිරසාර සංවර්ධන ප්‍රතිඵල ලබා ගත හැක.

කෙසේ වෙතත්, මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් වෙනස්කොට සැළකීම් හේතුවෙන්, බොහෝ විට අඩු කුසලතා ඇති, අඩු වැටුප් සහිත රැකියාවල බහුලව නියෝජනය වීම, අධිකව වැඩ කිරීම හේතුවෙන් දරිද්‍රතාවයෙන් පෙළීමේ දැඩි අවදානමකට මුහුණ දීම, ලිංගික හිංසනයට ලක් වීම වැනි සූරාකෑම්වලින් අසමාන්‍ය ලෙස පීඩාවට පත් වීම ඇතුළු සුවිශේෂී බාධාවන්ට මුහුණ දීමට කාන්තාවන්ට සිදු වේ.


*World Economic Forum, Global Gender Gap Report 2021




# ආසන්න වශයෙන් උතුරු පළාතේ සෑම නිවාස හතරෙන් එකකම මූලිකත්වය දරන්නේ කාන්තාවක් විසිනි.*

**ගෘහ මූලික කාන්තාවන් මුහුණ දෙන සීමිත ආදායම් උත්පාදන අවස්ථා වෙත වැඩි අවධානයක් ලක් කළ යුතුය. අධ්‍යයන වලින් පෙනී යන්නේ ගෘහ මූලික කාන්තාවන් වඩාත් අවදානමට ලක්විය හැකි කාණ්ඩයක් වන අතරම ඔවුන් සාමාන්‍යයෙන් අඩු ආදායම් ලාභීන් වන බවයි.**

*United Nations, Sri Lanka, Mapping of Socio-Economic Support Services to Female Headed Households in the Northern Province of Sri Lanka, 2015



# ලිංගික හිංසනය, ප්‍රචණ්ඩත්වය සහ ප්‍රචණ්ඩත්වයට ඇති බිය කාන්තාවන් ආර්ථිකව සවිබල ගැන්වීමේදී මුහුණ දෙන ප්‍රධාන බාධාවන් ලෙස හඳුනාගෙන ඇත


**"සේවායෝජකයින්, ප්‍රජා සාමාජිකයින් සහ සම්පත් බෙදා හැරීමේ නිලධාරීන් අතින් තමන් ලිංගික හිංසනයන්ට ලක් වූ බව කාන්තාවන්, විශේෂයෙන් ගෘහ මූලික කාන්තාවන්, සඳහන් කර ඇත."***

කුසලතා, සම්පත්, සේවා සහ වෙළඳපළ අවස්ථා සඳහා ප්‍රවේශය හා නියෝජනත්වයක් ලබා ගැනීම කාන්තා ආර්ථිකය සවිබල ගැන්වීමේ එක් අංශයකි; අනෙක් අතට, තීරණ ගැනීමේ හැකියාව සහ එම තීරණ සම්බන්ධයෙන් අදාළ පියවර ගෙන කටයුතු කිරීම ආර්ථික සවිබල ගැන්වීමේ තවත් පැතිකඩක් වේ. පෙර අවධියේදී, ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය ඉහළ නංවමින් ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා ලීඩ් (LEED) ව්‍යාපෘතිය සැලකිය යුතු දායකත්වයක් ලබා දී තිබිණි. මෙම ව්‍යාපෘතියේදී සමහර අංශ සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය අන්තර්කරණය කිරීම කෙරෙහි අවධානය යොමු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සාම්ප්‍රදායිකව පුරුෂයින් විසින් ආධිපත්‍යය දැරූ අවකාශයක් වූ ධීවර කර්මාන්තය සඳහා කාන්තා දායකත්වය කැපී පෙනුන අතර එමඟින් මෙම කර්මාන්තය ආශ්‍රිතව කාන්තාවන්ගේ වැඩි මැදිහත්වීමක් පෙන්නුම් කරන ලදී.

කෙසේ වෙතත්, ලීඩ් (LEED) ව්‍යාපෘතියේ අවසාන තක්සේරුව සහ ලීඩ්+ (LEED+) ව්‍යාපෘතියේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අතර පරතරය තක්සේරු කිරීම ඇතුළු අධ්‍යයන ගණනාවක් මඟින් පෙන්නුම් කෙරෙන්නේ ආර්ථික සවිබල ගැන්වීම සහ සහභාගීත්වය සැමවිටම සමාජ සවිබල ගැන්වීම සහ අන්තර්කරණය කිරීම බවට පරිවර්තනය නොවන බවයි. මෙය බල අසමතුලිතතාවයන් ශක්තිමත් කරන ගැඹුරට මුල් බැස ගත් අවිධිමත් හා විධිමත් ස්ත්‍රී පුරුෂ සමාජ නිර්ණයන් විසංයෝජනය කිරීම මත බෙහෙවින් රඳා පවතී.

*International Labour Organization - Local Empowerment through Economic Development (ILO-LEED) Gender Gap Assessment 2018

## වී වගා කරන සුළු සේවකයින්ගේ සාමාන්‍ය දෛනික වැටුප (2013 සහ 2017)




## කෘෂිකාර්මික කටයුතුවල කුලී වැඩ සඳහා සාමාන්‍ය දෛනික වැටුප

| ප්‍රදේශය | කාන්තාවන් සඳහා වැටුප් (රු.) | පිරිමින් සඳහා වැටුප් (රු.) | ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වැටුප් පරතරය |
|---|---|---|---|
| ඔඩ්ඩුසුඩාන්, මුලතිව් | 700 - 800 | 1,200 | 400 - 500 |
| වවුනියාව උතුර, වවුනියාව | 800 | 1,200 | 400 |
| පලෙයි, යාපනය | 800 | 1,200 - 3,000 | 400 - 2200 |

**කාන්තා දායකත්වයෙන් හා ජයග්‍රහණ අවප්‍රමාණය කරමින් කාන්තාවන්ට හානිකර වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ඇතැම් සම්මතයන් සමාජය තුළ අඛණ්ඩව දක්නට ලැබේ.**

උතුරු පළාතෙහි කණ්ඩායම් සාකච්ඡා වලදී සිදුකළ සොයාගැනීම් වලින් හෙළි වූයේ පුරුෂයින් තම කාන්තා සගයන්ට වඩා අධිකව වෙහෙස මහන්සි වී වැඩ කරන බවත්, වඩාත් දුෂ්කර රැකියා කිරීමේ හැකියාව තමන් සතුව ඇති බවත් පවසමින් වර්තමාන ස්ත්‍රී පුරුෂ සමාජභාවීය වැටුප් පරතරය සාධාරණීකරණය කරන බවයි. අනෙක් අතට, අවධානය යොමු කළ කාන්තා කණ්ඩායම් විශ්වාස කළේ කාන්තාවන් පුරුෂයන් හා සමානවම රැකියාවන්වල නියුතුව වෙහෙස මහන්සි වී වැඩ කරන නමුත් ඔවුන් තවමත් අඩු වැටුපක් ලබන බවයි.*

*International Labour Organization - Local Empowerment through Economic Development (ILO-LEED) Gender Gap Assessment 2018



# ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා ලීඩ්+ (LEED+) ප්‍රවේශය

අන්තර්කරණ ආර්ථික වර්ධනය යනු සියල්ලන්ටම සමාන අවස්ථා ලබාදීම සහ සංවර්ධන ක්‍රියාවලීන්ට සහභාගී වීමේ හැකියාව තහවුරු කිරීමයි. රටක ආර්ථිකය හා සංවර්ධනය පුළුල් කිරීමේ දී, කාන්තාවන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් (PWD) වැනි වඩාත් අවදානමට ලක්විය හැකි කණ්ඩායම් වෙත ළඟා වන විට මෙය විශේෂයෙන් සත්‍ය වේ.

ලීඩ්+ (LEED+) ව්‍යාපෘතිය කාන්තාවන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් (PWD) ඇතුළු ඉලක්කගත ප්‍රජාවන් සඳහා ගෞරවාන්විත රැකියා අවස්ථා වැඩිදියුණු උදෙසා බැඳී සිටිනු ඇත. ඒ සමගම ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSME), සමූපකාර (Coops) හා පළතුරු, එළවළු, ධීවර හා සැකසූ ආහාර යන අංශයන්හි මෙන්ම ප්‍රජාව තුළද තීරණ ගැනීමේදී කාන්තාවන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් (PWD) ගෙන් වැඩි සහභාගීත්වයක් ලබා ගැනීම උදෙසා ලීඩ්+ (LEED+) ව්‍යාපෘතිය වැඩි අවධානයක් යොමු කරනු ඇත.

උතුරු පළාතෙහි සංස්කෘතික හා සමාජීය සූක්ෂ්ම කරුණු සැලකිල්ලට ගතහොත්, පුරුෂාධිපත්‍යය බොහෝ දුරට එහි පවතින සම්මතයක් වනු ඇත. ඒ අනුව ලීඩ්+ (LEED+) ව්‍යාපෘතිය ඉතාමත් ප්‍රායෝගික, සන්දර්භ-විශේෂිත සහ නවීකරණය කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අන්තර්කරණ උපාය මාර්ග ක්‍රියාත්මක කොට අඛණ්ඩව ගවේෂණ කටයුතු සිදු කරනු ඇත.

# කාන්තා ආර්ථිකය සවිබල ගැන්වීම ශක්තිමත් කිරීම සහ ගෞරවාන්විත රැකියා සඳහා ප්‍රවේශය

**ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ආර්ථික සවිබල ගැන්වීම ඉතා වැදගත් වේ. ආර්ථිකයට කාන්තාවන් විශාල දායකත්වයක් ලබා දෙන නමුත් කලින් විස්තර කළ පරිදි ගෞරවාන්විත රැකියාවක් සුරක්ෂිත කර ගැනීමේ නොහැකියාව, ආර්ථික සම්පත්වලට ප්‍රවේශයක් නොමැතිකම, නොගෙවූ නඩත්තු කටයුතු හා සම්බන්ධ මූල්‍යමය බර සහ දරිද්‍රතාවයට මුහුණ දීම හේතුවෙන් ඔවුන් අසමානය ලෙස පීඩාවට පත් වී ඇත.**

## ක්‍රියාකාරී ප්‍රවේශය

ප්‍රථම පියවර වශයෙන්, ක්‍රියාවලි, කළමනාකරණය, තාක්ෂණය, වෙළඳපල ප්‍රවේශය සහ වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රමිති (OSH) සම්බන්ධ ව්‍යාපාර පුළුල් කිරීමේ අභියෝගයන්ට මුහුණ දීම සඳහා ලීඩ්+ (LEED+) ව්‍යාපෘතිය උතුරු පළාතෙහි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) හිමිකරුවන් සමඟ කටයුතු කළේය. පසුව, කලින් රැකියා අවස්ථා ප්‍රවේශයක් නොමැති කාන්තාවන් මෙම ව්‍යාපාර සමඟ සම්බන්ධ වූ අතර, මෙහි සාර්ථක ව්‍යාප්තිය තුළින් ඇති වූ නව රැකියා අවස්ථා වලින් ප්‍රයෝජන ගැනීමට ඔවුන්ට ඉඩ සැලසීය.

කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය තුළ කාන්තාවන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා, නිෂ්පාදන ගුණාත්මකභාවය, කාර්යක්ෂමතාව, වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රමිති (OSH) , සැපයුම් දාම කළමනාකරණය සහ තාක්ෂණික දැනුම පිළිබඳව ලීඩ්+ (LEED+) ව්‍යාපෘතිය විසින් කාන්තා ගොවීන් සඳහා පුහුණු ලබා දෙන ලදී. ජලජීවී වගාව ආශ්‍රිත මෙහෙයුම් වල නියුතු කාන්තාවන් සඳහා ගොවිපල කළමනාකරණය, තවාන් නඩත්තු කිරීම සහ අනෙකුත් දියුණු තාක්ෂණික උපක්‍රම පිළිබඳ පුහුණුව මෙයට ඇතුළත් වූ අතර, කෘෂිකර්මාන්තයේ නියුතු කාන්තාවෝ අස්වැන්න හා පසු අස්වනු කළමනාකරණය සහ නව යන්ත්‍රෝපකරණ භාවිතය ගැන ඉගෙනීමෙන් ප්‍රතිලාභ ලබා ගත්හ. ඊට අමතරව, සුදුසු රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවර්ධන සේවා (BDS) සපයන්නන් සමඟ සබඳතා ඇති කර ගැනීමට ගොවීන්ට සහාය විය.

කාන්තා ආර්ථික සවිබල ගැන්වීම සඳහා සමුපකාර සමිති සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතරම, කොහු, රටකජු, කව්පි, බඩ ඉරිඟු සහ මුහුදු කැකිරි වැනි කලින් හඳුනාගත්, ඉහළ ශක්‍යතාවයකින් යුත් සැපයුම් දාමයන් තුළට ප්‍රවේශ වීම සඳහා කාන්තාවන් හට ලීඩ්+ (LEED+) සහාය විය. අතිරේකව, මෙම ව්‍යාපෘතිය මගින් සමුපකාර සමිතිවල සාමාජිකයින්ට අවශ්‍ය තාක්ෂණික යෙදවුම් ලබා දීම, ගැනුම්කරුවන් සමඟ සාකච්ඡා කිරීම, වෙළෙඳපොළට ප්‍රවේශ වීම පහසු කිරීම සහ මූල්‍ය සාක්ෂරතාව වැඩි දියුණු කිරීමේ හැකියාව ශක්තිමත් කරන ලදී.

- පෞද්ගලික අංශය මෙන්ම සමුපකාර දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැනි රජයේ හවුල්කරුවන් ද මෙම සේවාවන් සැපයීමේදී සම්බන්ධ වූහ.

- අඩු කුසලතා සහ අඩු වැටුප් සහිත රැකියා (උදා■ දැල් සකස් කිරීම සහ මාළු එකතු කිරීම) තුළින් ආදායම් ලබන කාන්තාවන්ගේ ඉහළ සංචලනය කෙරෙහි අවධානය යොමු කරමින් මුහුදු ආහාර සැකසුම් මධ්‍යස්ථානවල ඔවුන්ගේ රැකියා තහවුරු කර ගැනීම සඳහා නිල්-පිහිනුම් (බ්ලූ-ස්විමර්) කකුළුවන් කර්මාන්තය සමඟ ලීඩ්+ (LEED+) සහයෝගයෙන් කටයුතු කළේය. මුහුදු ආහාර සැකසීම, තත්ත්ව සහතික කිරීම සහ වෙනත් ප්‍රවීණතා ක්ෂේත්‍රයන්හි පුහුණුව තුළින් සේවකයින්ගේ කුසලතාවයන් ඉහළ නැංවීම සඳහාද මෙම ව්‍යාපෘතිය තුළින් කළමනාකරණය සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදී. මේ හේතුවෙන් ආරම්භක සමිති සාමාජිකයින් බොහෝ දෙනෙකු මෙම සමාගම තුළ අධීක්ෂණ සහ කළමනාකරණ යන අංශවල තනතුරු පවා දැරූහ. එසේම, කොහු සහ අනෙකුත් කෘෂිකාර්මික අංශයන්හි ද එම ප්‍රවේශයම අනුගමනය කරන ලදී.

- ඉලක්කගත මැදිහත් වීම් කිහිපයක් හරහා කාන්තා ව්‍යවසායකයින්ට සහයෝගය දැක්වීම, තෝරාගත් සෑම ව්‍යවසායකයෙකු සඳහාම ව්‍යාපාර සැලසුම් සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා ලීඩ්+ (LEED+) උපකාර වූ අතර පිරිවැය හුවමාරු කරගත් ප්‍රවේශයක් තුළින් තම ව්‍යාපාර පුළුල් කර ගැනීමට මූල්‍යමය ආධාර සැපයීය. මෙම ව්‍යාපෘතියට අමතරව ව්‍යවසායකයින් හට අවශ්‍ය සේවා සපයන්නන්ගේ ජාලයකට ඔවුන්ව සම්බන්ධ කළ අතර ව්‍යාපාර වර්ධනය, අන්තර්ග්‍රහණය කිරීම සහ වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රමිති පිළිබඳ දැනුම හා කුසලතා ලබා ගැනීමට ආධාර සපයයි.

# "ජාතියේ උන්නතිය සඳහා කාන්තාවන් ආර්ථික වශයෙන් ස්වාධීන විය යුතුය: ඒ සඳහා කාන්තාවන්ට අවශ්‍ය ආරක්ෂිත හා විශ්වාසදායක පරිසරයක් සැකසීමේ වගකීම සෑම සේවා යෝජකයෙකුටම පැවරී ඇත."

**සුභාස්කරන්, හිමිකරු, කුවීන්ස් නිෂ්පාදන - මුලතිව්, ශ්‍රී ලංකාව**

කුඩා සමාගමක් වන ක්වීන්ස් නිෂ්පාදන (Queens Products) ලීඩ්+ (LEED+) ව්‍යාපෘතියේ සහයෝගයෙන් කාන්තාවන් සඳහා මූල්‍ය ආධාර, ළමා ආරක්ෂණ පහසුකම්, ණය උගුලේ සිරවී සිටින ගෘහ මූලික කාන්තාවන් සඳහා රැකියා ස්ථාන සංස්කෘතියේ වෙනසක් ඇති කරමින්ද ආරක්ෂිත සේවා පරිසරයක් ලබා දීමෙන්ද කාන්තාවන්ට විනීත රැකියාවන් සඳහාවූ ප්‍රවේශය ඉහළ නැංවීමේ පියවර ගෙන තිබේ.



# තහවුරු කිරීමේ ක්‍රියාවලීන් තුළින් අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම

තහවුරු කිරීමේ ක්‍රියාවලීන් තුළින් සත්‍ය සහ කාර්යක්ෂම සමනත්වතාවයක් කරා ළඟා විය හැක. මෙම ක්‍රියාවලීන් අඩු වරප්‍රසාදිත හෝ ආන්තිකකරණ තත්ත්වයන්ට මුහුණ දෙන සමාජ කණ්ඩායම් එකී අවස්ථා වලින් මුදවා ගැනීමට පිටුවහල් වේ. පුරුෂයින් හා කාන්තාවන් අතර සැලකිය යුතු අසමමිතිකභාවයක් පවතින සමාජයක, තහවුරු කිරීමේ ක්‍රියාවන් මඟින් විශේෂ පියවරයන් ක්‍රියාත්මක කිරීමේ අවස්ථා සඳහා ප්‍රවේශය ලැබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් එය සමාජ, ව්‍යුහාත්මක හා ආර්ථික අවාසි මඟහරවා ගැනීමට මෙන්ම බැහැර කිරීමටත්, අගතිය උදාසීන කිරීම සහ නියෝජනය සක්‍රීය කිරීමටත් උපකාරී වේ. කෙසේ වෙතත්, තහවුරු කිරීමේ ක්‍රියාවන් පුළුල් ලෙස පිළිගැනීම හා පුහුණු කිරීම සඳහා සමාජයේ සෑම තරාතිරමකම ආකල්පමය වෙනසක් අවශ්‍ය වේ.

## ක්‍රියාත්මකව පවතින ප්‍රවේශය

- සාරාංශයක් වශයෙන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, පෞද්ගලික සමාගම් සහ සමුපකාර සමිති සමඟ ඇති විය හැකි හවුල්කාරිත්වයන් ගැන ලීඩ්+ (LEED+) තක්සේරු කිරීමේදි ස්ත්‍රී පුරුෂ සමාජභාවය වැදගත් තේරීම් නිර්ණායකයක් ලෙස සැලකේ. මේ දක්වා අත්සන් කර ඇති හවුල්කාරිත්ව ගිවිසුම් 12 තුළ, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රධාන ධාරාවේ නිශ්චිත ක්‍රියා, භූමිකාවන් සහ වගකීම් පැහැදිලිව දක්වා ඇත. වඩාත් බලාපොරොත්තු තැබිය හැකි කරුණ නම්, ස්ථිරසාර ක්‍රියාකාරී වැඩසටහන් සඳහා වෙනම අයවැය රේඛාවක් සියලුම ගිවිසුම්වලට ඇතුළත් කර තිබීමයි.

- කාන්තාවන්ට නායකත්ව තනතුරුවල සහභාගී වීමට ඇති බාධක සැලකිල්ලට ගෙන, ලීඩ්+ (LEED+) විසින් පාණ්ඩතිරිප්පු සමුපකාර සංගමයේ රැස්වීම් වේලාවන් උදෑසන සිට සවස දක්වා වෙනස් කිරීමට සහ සති අන්තයේ එය සැලසුම් කිරීමට සාකච්ඡා ආරම්භ කළේය. මෙම වෙනස හේතුවෙන් ගෙදර දොරේ වැඩ සහ රැකවරණ වගකීම් සඳහා කාන්තාවන් විසින් වෙන් කළ වේලාව හා රැස්වීම් වේලාව අතර ගැටීමක් සිදු නොවන බව තහවුරු වූ අතර එමඟින් ඔවුන්ගේ නිතිපතා පැමිණීම දිරිමත් කළ අතර එය හේතුකොට ගෙන සමුපකාර මණ්ඩලයේ කාන්තා නායකත්ව අවස්ථා වැඩි දියුණු විය.

- එසේම, ආදායම් ඉපැයීමේ ක්‍රියාකාරකම්වල යෙදෙන අතරතුර, ළමා රැකවරණ අවශ්‍යතා කළමනාකරණය කර ගැනීමට කාන්තාවන්ට අපහසු වූ හෙයින්, පාසල් නිවාඩු කාලය තුළ ගුරුවරයෙකු සොයා ගැනීම සඳහාද ලීඩ්+ (LEED+) මලරම්බෝම් සමුපකාර සමිතියට සහයෝගය ලබා දුන්නේය සිදු කරනු ඇත.



# සමාජ ආකල්ප ආමන්ත්‍රණය කිරීම සහ කාන්තාවන්ගේ ස්ථාවරත්වය ඔවුන්ගේ ප්‍රජාවන් තුළ ශක්තිමත් කිරීම

කාන්තාවන් නොයෙක් ආකාරයේ ආන්තිකකරණයන්ට ලක්වූ බව ඉතිහාසය පුරාවටම දක්නට ලැබේ. වර්තමානයේදී පවා කාන්තාවන්ට එරෙහි සංස්කෘතික, සමාජීය හා ආර්ථික වෙනස්කම් කිරීම් සාධාරණ හැසිරීම් ලෙස සැලකේ. මෙම අකාල්ප බැහැර කිරීමට සහ අසමාන බල ගතිකතාවයන් නැවත සකස් කිරීමට නම් සමාජයක චින්තනයේ සාමූහික වෙනසක් අවශ්‍ය වේ මෙම පරිවර්තනීය වෙනස ඇති කළ හැකි ප්‍රධාන මෙවලමක් ලෙස "දැනුම හුවමාරු කර ගැනීම" හඳුනාගත හැක.

## ක්‍රියාත්මකව පවතින ප්‍රවේශය

- ආයතනික මට්ටමින් ආකල්ප ආමන්ත්‍රණය කිරීම, දැනුම හුවමාරු කිරීමේ ක්‍රියාවලිය පවත්වා ගැනීම සහ කාන්තා ආර්ථිකය යසවිබල ගැන්වීම සඳහා ලීඩ්+ (LEED+) රාජ්‍ය සේවකයින් සඳහා (පුහුණුකරුවන් පුහුණු කිරීමේ ටීඕටී (ToT) සැසි පැවැත්වීය.
- මීට අමතරව කාන්තාවන් තුළ නායකත්ව කාර්යභාරය වැඩි දියුණු කිරීම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, සමූපකාර, මෙන්ම සමාජ සේවා කටයුතුවල නියුක්ත වන කාන්තාවන්ට උපදේශන සහාය ලබා දීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙමින් පවතී.
- ලීඩ්+ (LEED+) සමුපකාර අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාජිකයින්, කාර්ය මණ්ඩලය මෙන්ම කොමසාරිස්වරුන්ගේ සහභාගීත්වයන් පළාත් මට්ටමේ සාකච්ඡා සංසද පැවැත්වීම සඳහා පහසුකම් සැලසීය. ආර්ථිකය තුළ කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීම, ව්‍යාපාර හිමි කාන්තාවන් මුහුණ දෙන සුවිශේෂී අභියෝග සහ සාර්ථක කාන්තා ව්‍යවසායකයින් සිය අත්දැකීම් හුවමාරු කර ගැනීම පිළිබඳව සාකච්ඡා කිරීමට මෙමගින් අවස්ථාව සලසා දෙන ලදී.
- සමුපකාර හා සමාජ ව්‍යවසායන්හි කාන්තාවන්ගේ දැනුම හා කුසලතා පුළුල් කරමින් ලීඩ්+ (LEED+) බස්නාහිර පළාත පුරා පිහිටි කෘෂිකාර්මික හා ධීවර සැකසුම් හා අගය එකතු කිරීමේ ඒකක වෙත යාම සඳහා නිරීක්ෂණ චාරිකා සංවිධානය කරන ලදී. අනෙකුත් කාන්තාවන් සමඟ පැවති අන්තර් ක්‍රියාකාරිත්වය වටිනා කුසලතාවන් ලබා ගැනීමට උපකාරී වූ අතර, අදහස් හුවමාරු කර ගැනීමට, සන්නිවේදනය සිදු කිරීමට සහ විශ්වාසය තහවුරු කිරීමට ද එමගින් අවස්ථාවක් සලසා දෙන ලදී.

**"සමාජ බාධක නොතකා, මා වැනි ගම් මට්ටමේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පවත්වාගෙන යන කාන්තාවන්ට ස්වාධීන වීම සඳහා සහයෝගය දැක්වීම පිළිබඳව ආඩම්බරයට පත්වෙමු."**

**ශර්මිලා, හිමිකරු, එස්.ටී.ආර් ඉන්ඩස්ට්‍රීස් (STR Industries) - කිලිනොච්චිය, ශ්‍රී ලංකාව**

තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කර ගැනීමේදී තිබූ බාධක බිඳ දමා ඒවා ජයගත් කාන්තා ව්‍යවසායිකාවක් වූ ශර්මිලා, ආශ්චර්යමත් සහ ආදර්ශවත් චරිතයකි. වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රමිති සහ උපදේශනයන් ලබාදීම් ඇතුළු ඇගේ ව්‍යාපාරය ශක්තිමත් කර ගැනීමට ගත් උත්සාහයන්හිදී ලීඩ්+ (LEED+) ඇයට විවිධ අයුරින් ආධාර කර ඇත.

# ආයතනික හා පද්ධතිමය බාධාවන් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම

දැනටමත් පවතින අසමානතාවයන් උග්‍ර කිරීමට උපකාරී වෙමින් පොදු ක්ෂේත්‍රය තුළ කාන්තාවන් හට බාධක රැසකට මුහුණ දීමට සිදු වී ඇත. මෙම බාධක ජය ගැනීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී ප්‍රතිචාර දැක්වීම් සහ මැදිහත් වීම් වර්ධනය කිරීම ඉතා වැදගත් වේ.

## ක්‍රියාත්මකව පවතින ප්‍රවේශය

- ප්‍රධාන වශයෙන් පුරුෂ කේන්ද්‍රීය සංස්කෘතියක් පවතින ධීවර අංශයේ සහ සමුපකාර අංශය තුළ තීරණ ගැනීමේ වෙනසක් ඇති කිරීමට ලීඩ්+ (LEED+) කටයුතු කළ අතර එම උත්සාහයන් සාර්ථක විය. සමුපකාර සමිති තුළ සාමාජිකත්වය, සම්පත් බෙදා හැරීම, සාමාජිකයින්ගේ ආර්ථික සහභාගීත්වය සහ සේවාවන් පිළිබඳව තීරණ ගැනීම් බහුලව සිදු කරනු ලබන්නේ පිරිමින් විසින් වන අතර, කාන්තා සාමාජිකාවන් හට මෙම තීරණ වලින් කිසිදු ප්‍රයෝජනයක් සිදු නොවුනු අතර ඔවුන්ගේ අදහස්ද සැලකිල්ලට නොගනී. සාමාජිකයින් සහ මණ්ඩලය දැනුවත් කිරීමේ සැසි මෙන්ම පළාත් මට්ටමේ සාකච්ඡා තුළින් ව්‍යාපෘතිය මෙය වෙනස් කිරීමට කටයුතු කළේය. වැඩිපුර කාන්තා සාමාජිකාවන් ඇතුළත් කර ගැනීමට ප්‍රතිපත්තිමය තීරණ ගනු ලැබූ අතර, එය අඛණ්ඩ බලපෑම් සහ උපදේශන උත්සාහයන් වල ප්‍රතිඵලයක් විය. මෙම නියෝජනය මඟින් සමුපකාර සේවා සැපයීම, සම්පත් වෙන් කිරීම සහ ආර්ථිකය තුළ කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීමට වැඩි බලපෑමක් වනු ඇත.

- වලෙයිපඩු වල ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ධීවර කටයුතු බව හඳුනා ගත් ලීඩ්+ (LEED+) විසින් ආර්ථික කටයුතු සහ ධීවර සමිති යන දෙඅංශයේම කාන්තා සහභාගීත්වය සහතික කිරීම සඳහා ද්වි පාර්ශවික උපාය මාර්ගයක් ක්‍රියාත්මකක කළේය. මුලදී කාන්තාවන් සහ පිරිමින් සඳහා වෙන වෙනම සාකච්ඡා සංසද සංවිධානය කිරීම - එහිදී කාන්තාවන් තමන් මුහුණ දුන් ගැටලු පිළිබඳව සාමූහිකව සාකච්ඡා සිදු කිරීමට අවස්ථාව ලැබුණු අතර, භාෂණය දිරිමත් කරන ලද අතර ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අන්තර්කණය කිරීම සහ කාන්තාවන්ගේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම උදෙසා පුරුෂ පාර්ශවය සඳහා වූ සංසද භාවිතා කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වැඩි වැඩියෙන් සංවාද ඇති වී තිබූ අතර ඇතැම් බාධක ඉවත් වීම මඟින් කාන්තාවන්ට ධීවර කටයුතු සඳහා සහභාගී වීමට සහ සමුපකාර කටයුතු සඳහා සම්බන්ධ වීමට අවස්ථාව උදා විය.

- පුදුක්කුඩියුරුප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෘෂිකර්මාන්තයේ නියුතු කාන්තාවන් විශාල පිරිසක් මුහුණදෙන අඩු සහයෝගීත්වය පියවා ගැනීම සඳහා, ලීඩ්+ (LEED+) ඔවුන්ට සීමාසහිත පුදුක්කුඩියිරුප්පු කාන්තා ව්‍යවසායකයින්ගේ සමුපකාර සමිතිය පිහිටුවීමට සහාය විය. යුද්ධයෙන් පීඩාවට පත් බොහෝ කාන්තාවන් සහ ගෘහ මූලික කාන්තාවන් (FHH) ප්‍රධාන වශයෙන් පිරිමින් විසින් කළමනාකරණය කරන ලද ප්‍රදේශවල පැවති සමුපකාර සමිතින්ගෙන් බැහැර කිරීමත් සමඟ මෙම නව ආයතනය මඟින් කාන්තාවන්ට කළමනාකරණ හා නායකත්ව භූමිකාවන් සඳහා සහභාගී වීමටත්, නව ව්‍යාපාර හවුල්කාරිත්වයන් වර්ධනය කර ගැනීමටත්, ඔවුන්ගේ අවශ්‍යතා හා ගැටලු සාකච්ඡා කිරීමටත් අවකාශයක් සැලසී ඇත. ඊට අමතරව, එය ප්‍රජාව තුළ කාන්තාවන්ගේ හැකියාවන් පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව අදහස් බිඳ දැමීමට උපකාරී විය.

> "සාමූහිකව එකට එක් වී හඬනැගීම සඳහා සමුපකාර මට්ටමින් කාන්තාවන් වැඩි වශයෙන් සිටිය යුතු අතර මෙය සිදු කිරීම සියලු කාන්තාවන්ගේ වගකීමකි."

**කලෛචෙල්වි, සභාපති, පුදුක්කුඩියිරුප්පු කාන්තා ව්‍යවසායකයින්ගේ සමිතිය**

ලීඩ්+ (LEED+) හි සහය ඇතිව පුදුක්කුඩියිරුප්පු (PTK) යනු ශ්‍රී ලංකාවේ, මුලතිව් දිස්ත්‍රික්කයෙන් බිහිවූ පළමු කාන්තා සමුපකාර සමිතියයි. ඒ හරහා කාන්තා ව්‍යවසායකයින්ට ණය පහසුකම් සහ සමාජ සුභසාධන වැඩසටහන් සඳහා ප්‍රවේශය ලබා ගැනීමේදී හවුල් මිලදී ගැනීම් සහ අලෙවිකරණය කිරීමේ සියලු ප්‍රතිලාභ භුක්ති විඳීමට මේ තුළින් හැකි විය.



# ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රමුඛතාවය දීම සඳහා උතුරු පළාතේ පද්ධතිමය ව්‍යුහය ශක්තිමත් කිරීම

මේ වන විට උතුරු පළාත තුළ කාන්තාවන්ගේ සමාජ සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා ආධාරක සේවා සැපයීම සඳහා වෙන්වූ ඒකකයක් හෝ සම්පත් වෙන් කිරීමක් හෝ සිදුකර නැත. මූල්‍ය ආධාර, වෙළඳපල තොරතුරු, තාක්ෂණික සහය, නිපුණතා සංවර්ධනය සහ පුහුණුව ඇතුළුව දැනට පවතින බොහෝ සේවා හා වැඩසටහන් වෙත ප්‍රවේශ වීමේදී බිම් මට්ටමේ කාන්තාවන් අභියෝගවලට මුහුණ දෙති. මෙම දුෂ්කරතා ලිහිල් කිරීමේ මාධ්‍යයක් ලෙස උතුරු පළාත් සභාවේ කාන්තා කටයුතු අමාත්‍යාංශය පළාත සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය සඳහා වූ ප්‍රතිපත්තියක් සකස් කිරීමේ උත්සාහයන් ආරම්භ කර තිබේ. ප්‍රාථමික මට්ටමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ප්‍රමුඛතාව සහතික කිරීම සහ කාන්තාවන්ගේ සහභාගීත්වය මෙන්ම සේවාවන් සඳහා ප්‍රවේශය වැඩි කිරීම සඳහා සහාය වීමට අමතරව, බිම් මට්ටමේ සිට ආරම්භ වූ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රමුඛතාව අඛණ්ඩව පවත්වාගෙන යාමට ද මෙම ප්‍රතිපත්තිය තුළින් ඉඩ සලසයි.

## ක්‍රියාත්මකව පවතින ප්‍රවේශය

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිපත්තිය වැඩිදියුණු කිරීමේ දී අධික සහභාගීත්ව ප්‍රවේශයකට පහසුකම් සැලසීමේ අරමුණින්, ලීඩ්+ (LEED+) උතුරු පළාතේ සෑම දිස්ත්‍රික්කයකම උපදේශන වැඩමුළු සහ රැස්වීම් පැවැත්වීම සඳහා මූල්‍ය ආධාර සපයයි. එවැනි සාකච්ඡා මඟින් ප්‍රජාව ඇතුළු විවිධ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා අවකාශය සලසා ගත හැකිය.
- ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම සඳහා, ලීඩ්+ (LEED+) අමාත්‍යාංශය වෙනුවෙන් විශේෂඥ දැනුම ලබා ගැනීම, නීති උපදේශකත්වය ඇතුළු තාක්ෂණික යෙදවුම් ලබා දීම ද සිදු කරයි.

"උතුරු පළාත ස්ත්‍රී පුරුෂ සමාජභාවය සඳහා වූ ප්‍රතිපත්තිය, දෙපාර්තමේන්තු මට්ටමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ධාරාව තුළට ගෙන ඒමට සහ එය ප්‍රජා මට්ටමේ වෙනස්කම් සාක්ෂාත් කර ගැනීමට අපට උපකාරී වන තීරණාත්මක මෙවලමකි."

**නිරූඛරාජ් ලාහිණි, සහකාර ලේකම්, කාන්තා කටයුතු, පුනරුත්ථාපන, සමාජ සේවා, සමුපකාර, ආහාර සැපයුම් සහ බෙදාහැරීම්, කර්මාන්ත සහ ව්‍යවසාය ප්‍රවර්ධනය සහ වෙළඳ සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය - උතුරු පළාත**

"පරිවර්තනීය වෙනසක් අත්දැකීමට කාලයක් ගත වන නමුත්, ලීඩ්+ (LEED+) ව්‍යාපෘතිය සිදු කරන්නේ මෙම වෙනස්වීම් සිදු වීමට අඩිතාලමක් දැමීම වන අතර, මෙහි සාර්ථකත්වය පිළිබඳව ධනාත්මක සංඥා දැනටමත් දක්නට ඇත."

**ආචාර්ය තෝමස් ක්‍රිං, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ශ්‍රී ලංකා, ලීඩ්+ (LEED+) ව්‍යාපෘතියේ ප්‍රධාන තාක්ෂණික උපදේශක**

Supported by the Australian Government Department of Foreign Affairs and Trade (DFAT) and the Government of Norway, the LEED+ (Local Empowerment through Economic Development and Reconciliation) project is part of the ILO's Global Jobs for Peace and Resilience programme.

For further information, contact:

Dr. Thomas Kring,
Chief Technical Advisor,
ILO, Sri Lanka
kring@ilo.org

Mehala Sabeswaran,
Gender and Disability Officer – LEED+,
ILO, Sri Lanka
sabeswaran@ilo.org

Kaushalya Kathireson
Communication and
Public Information Officer – LEED+,
ILO, Sri Lanka
kathireson@ilo.org

ilo.org | Twitter | Facebook | Instagram